*සැ. යු.* - 2012.05.18 වැනි දින පළවූ අංක 1,759 දරන *ගැසට් පත්‍රයේ* I:III හා IV (අ) කොටස් පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2008 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,760 - 2012 මැයි මස 25 වැනි සිකුරාදා - 2012.05.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | 562 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | –– | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | –– | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | –– | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 562 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - (i) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා පරිගණක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුදල් පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# රජයේ නිවේදන

## වන්නිවලාංකුලම් ශ්‍රී මුතුමාරිඅම්මන් පොංකල් උත්සවය - 2012

මුලතිව් දිස්ත්‍රික්

ඉහත සඳහන් පොංකල් උත්සවය 2012 ජුනි මස 01 වැනි දින පෙරවරු 6.00 ට පටන් ගෙන 2012 ජුනි මස 02 දින පෙරවරු 10.00 ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගුවනවා ඇත.

එන් වෙදනායහන්,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2012 අප්‍රේල් මස .. වැනි දින.

05-543

## මාතර තොටමුණ පොසොන් මහ පෙරහැර

දකුණු පළාත, මාතර දිස්ත්‍රික්කය පවත්වනු ලබන 2012 පොසොන් මහ පෙරහැර 2012 ජුනි මස 04 වැනි දින පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනත යටතේ (175 පරිච්ඡේදයේ) 1959 නොවැම්බර් මස 20 වැනි නිකුත් කරන ලද 11959 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසිවල 10 වැනි වගන්තිය යටතේ මෙයින් දන්වමි.

බී. රණවීර,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2012 මැයි මස 8 දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-620

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව - ජා-ඇල අධිශ්‍රේණි ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2012.03.22 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම සහ ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් එන්. ටී. පතිනායක විසින් සහතික කරන ලද 2011.06.29 දිනැති අංක 1423 දරන උකස් බැඳුම්කරය, මත මුල් මුදල හා 2012.02.23 දින තෙක් පොළිය වශයෙන් රුපියල් අසූපන් ලක්ෂ පනස් දෙදහස් අටසිය හැත්තෑවයි ශත හතරක මුදල (රු. 85,52,870.04) සමග රුපියල් අසූ එක් ලක්ෂ හැත්තෑ දහස් හාරසිය අසූ පහයි ශත අසූ දෙකක මුදලක් (රු. 81,70,485.82) මත වසරකට සියයට දාහතයි දශම පහයි බිංදුව (17.50%) බැගින් පොලියක් 2012.02.24 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් ජාඇල, ඒකල, අගරදගුරු මාවතේ අංක 10/23ඩී හි පිහිටි ෆර්නැන්ඩු රිෆ්‍රිජරේෂන් ඇන්ඩ් එයාකන්ඩිෂනින් වර්කර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂවරුන්ගෙන් (වර්ණකුලසූරිය සුරේෂ් අනුජ ප්‍රනාන්දු මහතා සහ හෙට්ටිආරච්චිගේ තෙරේස් අනුෂියා ද සිල්වා මහත්මිය) අයවිය යුතුව ඇත.

2. එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් අසූපන් ලක්ෂ පනස් දෙදහස් අටසිය හැත්තෑවයි ශත හතරක මුදල (රු. 85,52,870.04) සමග 2011.06.29 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අය කර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා වෙත එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය හා එහි සංශෝධනවල) 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ ජාඇල ශාඛාවේ අයකර ගැනීම් නිලධාරී/ශාඛා කළමනාකරුට මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලයේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දඬුගම උප කාර්යාලයේ, ඒකල පිහිටි අගරදගුරු මාවතේ වරිපනම් අංක 38 දරන ඒකල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2008 සැප්තැම්බර් 03 දිනැති අංක 5780 දරන පිඹුරෙහි ලොට් P උතුරට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 7257 දරන පිඹුරෙහි නිරූපිත ලොට් Y ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 13B ද, දකුණට : අගරදගුරු මාවත ද, නැගෙනහිරට : අඩි 20 පළල පාරට වෙන්කළ කොටස (එකී බිම් ප්‍රමාණයකින් යුක්තව එහි වැවෙන ගහකොළ, පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියළු දේද වන අතර මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B227/212 හි ලියාපදිංචි කර ඇත.

එනම් එකී ලොට් P ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල පහත සඳහන් ඉඩමෙහි නැවත මැනීමකි :-

එකී ඒකල පිහිටි අගරදගුරු මාවතේ, වරිපනම් අංක 38 දරන ඒකල එස්ටේට් නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1982 සැප්තැම්බර් 20 දිනැති අංක 6768 දරන පිඹුරෙහි සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩී. වී. අයි. නානායක්කාර විසින් සාදන ලද 1976 මාර්තු 08 දිනැති අංක 337 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 13B ද, දකුණට : ගම් සභා පාර ද, බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටසද මායිම්ව එකී අංක 6768 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි වැඩෙන ගහකොළ, එහි ඇති ගොඩනැගිලි හා වෙනත්

සියළු දේ ද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B227/212 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. එම්. යූ. සේනානායක,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
ජාඇල.

05-548

---

පී. වී. 61606.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සිංගපූර් පයිලිං ඇන්ඩ් බිල්ඩිං කන්ස්ට්‍රක්ෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.10.14 දින සංස්ථාපිත සමාගමක් වන "සිංගපූර් පයිලිං ඇන්ඩ් බිල්ඩිං කන්ස්ට්‍රක්ෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සිංගපූර් පයිලිං ඇන්ඩ් බිල්ඩිං කන්ස්ට්‍රක්ෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

05-542

---

පී. වී. 67886.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "කන්ටිනෙන්ටල් එක්ස්පෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.05.25 දින සංස්ථාපිත සමාගමක් වන "කන්ටිනෙන්ටල් එක්ස්පෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "කන්ටිනෙන්ටල් එක්ස්පෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

05-544

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.